සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
**Sabaragamuwa Provincial Department of Education**

දෙවන වාර පරීක්ෂණය 2018 — 11 ශ්‍රේණිය
முதலாம் தவணைப் பரீட்சை 2018 — தரம் 11
**Scond Term Test 2018 — Grade 11**

ඉතිහාසය II — පැය තුනයි
**History II — Three hours**

සැලකිය යුතුයි:

- I කොටසේ පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.
- II කොටසින් ප්‍රශ්න 4 කට ද III කොටසින් ප්‍රශ්න එකකට ද පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 06 කි.

---

## I කොටස

(01) (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල සපයා ඇති ලෝක සිතියම් කොටසෙහිද ලකුණු කර නම් කරන්න.

(i) කලා ඔය, සලාවත්තොට, යෝධ වැව, පාහියංගල, අනුරාධපුරය, නල්ලූර්, ලංකා පටුන, හුරුළු වැව, සෙංකඩගල, ගෝඨ පබ්බත (ගොඩවාය) මහියංගනය. (ලකුණු 12)

(ii) රෝමය, ඇලෙක්සැන්ඩ්‍රියාව, බතාවිය, බ්‍රිතාන්‍ය දූපත්, සිංදු ගඟ, සුභපැත්මේ තුඩුව (ලකුණු 06)

(ආ) පහත A B C D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු හා සම්බන්ධ පුද්ගලයින් කවුරුන්දැයි අනුපිළිවෙලින් ලියන්න.

A. ශ්‍රී ලංකාවේ තානාපතිවරයෙකු රෝමයට ගොස් වීදුරු පබළු ගෙන ආ කාලයේ දී මෙරට පාලනය කළ රජතුමා.

B. ගම්පොල රාජ්‍ය සමයේදී මෙරට ආක්‍රමණය කළ චීන සේනාධිපතියා.

C. ශ්‍රී ලංකාවේ ප්‍රථම බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා

D. රජු රටවැසියාට ඊශ්වරයෙකු බව දැක්වෙන දඹුලු විහාරයේ සෙල්ලිපියක සඳහන් රජතුමා.

- **පහත A හා B යටතේ දක්වා ඇති පිංතූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

(ඉ) (i) A පිංතූරයෙන් දැක්වෙන පුද්ගලයාගේ නම කුමක්ද?

(ii) මෙතුමා පාලනය කළ ඓතිහාසික නගරය කුමක්ද?

(iii) මෙතුමා විසින් මෙරටින් පාලවාහරින ලද විදේශීය ජාතිය කවුරුන්ද?

(iv) මෙම පිංතූරය අඳින ලද්දේ කවරෙකු විසින්ද?




(ඊ) (i) B වලින් දැක්වෙන නිර්මාණයේ නම කුමක්ද?

(ii) මෙම නිර්මාණය භාවිත වූයේ කුමන කර්මාන්තයක් සඳහාද?

(iii) මෙම නිර්මාණය බිහි වූ රාජ්‍ය කුමක්ද?

(iv) මෙම නිර්මාණය සිදුකළ පුද්ගලයා කවරෙක්ද?



## II කොටස

(02) (i) ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූ තෙත් කලාපයේ ලෙන් තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) පහත සඳහන් ජනාවාස හා සම්බන්ධ වෘත්තිකයින් පිළිවෙලින් නම් කරන්න.

අ. ගෝපාලගාම ඇ. කේවට්ටගාම

ආ. කසීකාරගාම ඉ. මනිකාරගාම (ලකුණු 04)

(iii) පූර්ව ඓතිහාසික යුගයේ ජනාවාසවලට ස්වභාවය කරුණු දෙකක් උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(iv) මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යුහය හා ස්වරූපය කරුණු තුනක් ඔස්සේ පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(03) (i) දේශපාලන බලය මධ්‍යගත වීමේදී විවිධ රාජ්‍යත්ව සංකල්ප බිහිවිය. එසේ බිහිවූ රාජ්‍යත්ව සංකල්ප තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) ශ්‍රී ලංකාවේ රාජ්‍ය උරුමය ලැබෙන ආකාර දෙක සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) මෙරට පාලනය කළ ශ්‍රේෂ්ඨ රජවරු දෙදෙනෙකු වන දුටුගැමුණු හා වසභ රජවරුන්ගේ සේවාවන් පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) මෙරට පැරණි සාමාජයේ ආර්ථිකය කරුණු තුනක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 06)

(04) (i) පහත සඳහන් වැව් කරවන ලද රජවරුන් කවුරුන්දැයි අනුපිළිවෙළින් ලියා දක්වන්න. (ලකුණු 03)

A- මින්නේරිය වැව

B- බසවක්කුලම වැව

C- කලා වැව

(ii) අපේ රටේ පැරණි ජනයා ජලය රැක ගැනීම සඳහා යොදාගත් උපක්‍රම දෙකක් සඳහන් කරන්න.

(ලකුණු 04)

(iii) ශ්‍රී ලංකාවේ පුරාණ යකඩ නිස්සාරණ තාක්ෂණය ඉතා දියුණු මට්ටමක පැවති බව කරුණු දෙකක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) ඓතිහාසික යුගයේ මෙරට සමාජ සංවිධානය සැකසී තිබූ ආකාරය කරුණු තුනක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 06)

(05) (i) ශ්‍රී ලංකාවේ පළමුවන නාගරීකරණ යුගයට අයත් පාලන මධ්‍යස්ථාන දෙකක් ද, දෙවන නාගරීකරණ යුගයට අයත් පාලන මධ්‍යස්ථාන එකක්ද නම් කරන්න. (ලකුණු 03)

(ii) පළමුවන නාගරීකරණ යුගයට අයත් අවසන් පාලන මධ්‍යස්ථානය බිඳ වැටීමට හේතු වූ කරුණු 4 ක් ලියා දක්වන්න. (ලකුණු 04)

(iii) ශ්‍රී ලංකාවේ දෙවන නාගරීකරණ මධ්‍යස්ථාන වශයෙන් තෙත් කලාපීය ස්ථානයක් තෝරා ගැනීමට පදනම් වූ කරුණු දෙකක විස්තර කරන්න. (ලකුණු 05)

(iv) මෙරට පාලනය කළ ශ්‍රේෂ්ඨතම පාලකයෙකු වශයෙන් දෙවන පරාක්‍රමබාහු රජතුමා ඉටුකළ කාර්යය කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(06) (i) පෘතුගීසීන්ගේ රැකවරණ ලැබූ පහත සඳහන් අය බෞතිස්ම ලැබීමෙන් පසුව හැඳින්වූ නම් පිළිවෙලින් ලියා දක්වන්න. (ලකුණු 03)

A. කුසුමාන දේවිය

B. යමසිංහ බණ්ඩාර

C. කොනප්පු බණ්ඩාර

(ii) උඩරට රාජධානියේ වැරදිකරුවන්ට ලබාදුන් දඬුවම් 4 ක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) පළමුවන විමලධර්මසූරිය රජතුමා විසින් ඉටුකළ ආගමික, ආර්ථික හා පෘතුගීසීන්ගෙන් උඩරට රාජ්‍යය බේරා ගැනීමට අනුගමනය කළ පියවරයන් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) මහනුවර රාජධානියේ සමාජ සංවිධානය සකස්ව තිබූ ආකාරය උදාහරණ තුනක් සහිතව විස්තර කරන්න. (ලකුණු 06)

(07) (i) විදේශ ආධිපත්‍යයෙන් ශ්‍රී ලංකාව මුදවා ගැනීමට උඩරටියන් විසින් 1818 නිහස් සටනේ නායකයින් දෙදෙනෙකු ද, 1848 සටනේ එක් නායකයෙකුද නම් කරන්න. (ලකුණු 03)

(ii) 1818 නිදහස් සටන අසාර්ථක වීමට හේතු දෙකක් ද 1848 නිදහස් සටන අසාර්ථක වීමට හේතු දෙකක් ද සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) කෝට්ටේ රාජ්‍ය පෘතුගීසීන් යටතට පත්වීමට බලපෑ හේතු 2 ක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) පෘතුගීසීන්ට හා ලන්දේසීන්ට කන්ද උඩරට රාජ්‍ය යටත් කර ගැනීමට නොහැකි වූයේ කුමක් නිසාදැයි සාධක තුනක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

## III කොටස

(08) (i) පුනරුද සමයේ සාහිත්‍ය පොත්පත් රචනා කළ එංගලන්තයේ සිටි ග්‍රන්ථ කතුවරු තිදෙනෙකු නම් කරන්න. (ලකුණු 03)

(ii) පහත ABC හා D යටතේ ඓතිහාසික තොරතුරු හා සම්බන්ධ පුද්ගලයන් කවුරුන්දැයි අනුපිළිවෙලින් ලියා දක්වන්න. (ලකුණු 04)

A- මොනාලිසා චිත්‍රය සිතුවම් කළ චිත්‍ර ශිල්පියා

B- පිලිපීන් දූපත් සොයාගත් දේශගවේෂකයා.

C- අප්‍රිකානු දකුණු තුඩුවට "කුණාටු තුඩුව" වශයෙන් නම්කළ දේශ ගවේෂකයා.

D- මුද්‍රණ යන්ත්‍රය නිපද වූ පුද්ගලයා.

(iii) ශාස්ත්‍රීය පුනරුදය යටතේ ප්‍රබෝධයක් සිදුවූ අංශ දෙකක් පැහැදිලි කරන්න.

(iv) දේශ ගවේෂණය සඳහා පුනරුදය බලපෑ ආකාරය නිදසුන් මගින් විස්තර කරන්න.


(09) (i) බ්‍රිතාන්‍යයේ කාර්මික විප්ලවය තුළ දක්නට තිබූ ප්‍රධාන කර්මාන්ත 3 කුමක්ද? (ලකුණු 03)

(ii) බ්‍රිතාන්‍ය යුරෝපයේ සෙසු රටවලට වඩා කාර්මික නිෂ්පාදන ක්ෂේත්‍රයේ ඉදිරියට පැමිණීමට බලපාන ලද කරුණු 04 ක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) කාර්මික විප්ලවයට සමගාමීව කෘෂි ක්ෂේත්‍රයෙහි ද විශාල වර්ධනයක් සිදුවිය. කරුණු 2 ක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) කාර්මීකරණයේ අහිතකර ප්‍රතිඵල තුනක් නිදසුන් දක්වමින් විස්තර කරන්න. (ලකුණු 06)

01. (අ) කොටසට පිළිතුරු ලිවීම සඳහා යොදා ගන්න.



01. (ආ) කොටසට පිළිතුරු ලිවීම සඳහා යොදා ගන්න.

